# පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාර්ය - 2010

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම

පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාර්ය විසින් 2011 පෙබරවාරි 28 දින කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර, රු.1,618,144 ක ගිණුම්කරණ අඩුපාඩු ගැලපීම් කිරීමෙන් පසුව නැවත 2011 අගෝස්තු 02 දින අධිකාර්ය විසින් අවසන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාර්ය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාර්යයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රු.6,306,189 ක් වූ සමාලෝචිත වර්ෂයේ ක්ෂය, ක්ෂය වෙන් කිරීමේ ගිණුමට බැර කිරීමට අමතරව ඊට සමාන වටිනාකමක් විලම්භිත ආදායම් ගිණුම හර කර විවිධ ආදායම් ගිණුම බැර කර තිබුණි. ක්ෂය වෙන් කිරීම් සඳහා වූ ගිණුම්කරණ සටහන මගින් මේ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ උපචිත වියදම් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතු කොටගෙන ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර රු.2,901,401 ක වෙනසක් නිරූපණය විය. එම වෙනස ප්‍රවර්ථන වර්ෂයේ වියදම් ගිණුම්වලට ගැලපීම නිසා වියදම් ගිණුම් 22 ක එකතුව රු.2,901,401 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2010 ඔක්තෝබර් මස දඩ මුදල් ආදායම ලෙස අධිකාරිය වෙත ලැබී තිබුණු එකතුව රු.1,246,064 ක ගෙවිය යුතු ශේෂ යටතේ වූ පාරිභෝගික ආරක්ෂණ අරමුදල සඳහා වෙන් කිරීමේ ගිණුමෙහි ඇතුළත් කර තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල විකුණන ලද ස්ථාවර වත්කම්වල පිරිවැය රු.2,454,630 ක් ලෙස දක්වා තිබුණද සත්‍ය විකුණුම් වත්කම්වල පිරිවැය රු.2,442,859 ක් වීම නිසා රු.11,771 ක වෙනසක්ද, මූල්‍ය ප්‍රකාශනවල දඩ මුදල් ආදායම රු.11,823,067 ක් ලෙස දකවා තිබුණද ප්‍රගති වාර්තා අනුව එය රු.11,416,900 ක් ලෙස දක්වා තිබීම නිසා රු.406,167 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

----------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ ඒකකයක් පිහිටුවා තිබුණු අතර, ඒ සඳහා වැය කර තිබුණු මුදල රු.400,000 ක් විය. පර්යේෂණ ඒකකය පිහිටවීම සඳහා වූ අනුමැතිය, ඉදිරි සැලසුම් හා කාර්යසාධන සාක්ෂි නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැක විය.

## 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(1) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

(i) පනතේ 27 වන වගන්තිය අනුව සෑම වෙළෙන්දෙකුම මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන රු.100,000 ක් නොඉක්මවූ වාර්ෂික ගාස්තුවක් ගෙවීම මත අධිකාරියේ ලියාපදිංචි විය යුතු වුවත් මේ දක්වා කිසිදු වෙළෙන්දෙකු ලියාපදිංචි කිරීමට අධිකාරිය ක්‍රියා කර නොතිබුණි. මෙය ප්‍රායෝගිකව සිදු කිරීම අපහසු බව අධිකාරිය විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ii) පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ සාමාජිකයන් අදාල ක්ෂේත්‍රයන්හි පිළිගත් සුදුසුකම්, පළපුරුද්ද හා විශිෂ්ඨත්වයක් ලබා ගත්තවුන් විය යුතු වුවත් සාමාජිකයින් 08 දෙනෙකු ඒ ඒ විෂය ක්ෂේත්‍ර වල පිළිගත් සුදුසුකම් සපුරා නොතිබුණි.

(2) 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (5) (සී) වගන්තිය අනුව අධිකාරිය සම්බන්ධයෙන් අවම අභ්‍යන්තර විගණන වැඩසටහනක් විගණකාධිපති සමඟ එකඟ වී සකස් කර ගත යුතු වුවත්, 2010 වර්ෂය තුළදී අධිකාරියේ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක නොවීය.

(3) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 5.1.3 ජේදය හා 5.2.1 ජේදය අනුව අධිකාරිය විසින් සංයුක්ත සැලැස්මට අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශය, ශේෂ පත්‍රය, මුදල් පවාහ ප්‍රකාශය හා මූලධන වියදම් අන්තර්ගත කළ යුතු වුවත් අධිකාරිය විසින් සංයුක්ත සැලැස්ම සමඟ අදාල තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 9.2 ජේදය අනුව අධිකාරියේ එක් එක් අංශ සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව ඇතුළත් ඒකාබද්ධ මානව සම්පත් අයවැයක් සංයුක්ත සැලැස්මට ඇතුළත් කළ යුතු වුවත් අධිකාරිය විසින් සංයුක්ත සැලැස්මට මානව සම්පත් අයවැයක් ඇතුළත් කර නොතිබුණි.

(iii) 9.10 ජේදය අනුව කොන්ත්‍රාත් අනියම් හෝ වෙනත් ආකාරයක පත්වීමක් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මත සිදු කළ යුතු වුවත් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2009 වර්ෂය තුළ කොන්ත්‍රාත්, අනියම් හා දෛනික සේවකයින් 05 දෙනෙකු හා 2010 වර්ෂය තුළ කොන්ත්‍රාත් සේවකයින් 13 දෙනෙකු බඳවාගෙන තිබුණ අතර, ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(v) 9.14.2 ඡේදය අනුව පරිපාලන කයා පරිපාටි අත්පොත සඳහා අනුමැතිය ලබා ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හරහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වූවත් අධිකාරිය විසින් පිළියෙල කර තිබූ පරිපාලන ක්‍රියාපටිපාටි අත්පොත අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(4) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාද ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 වගන්තිය අනුව අත්තිකාරම් මුදල අදාල කාර්යය නිම කළ විගස පියවිය යුතු වූවත් 2006 සිට 2010 නොවැම්බර් දක්වා විටින් විට ගෙවා තිබුණු අත්තිකාරම් මුදල්වලින් රු.125,061 ක් 2010 දෙසැම්බර් 31 වනවිටත් පියවා නොතිබුණි.

(5) 2010 පෙබරවාරි 08 දිනැති හා අංක ඩීඑම්එස්/ඊ4/41/5/255/2 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ 03 ඡේදය අනුව අධිකාරියේ සේවක ප්‍රතිව්‍යුහගතකරණය සඳහා තනතුරුවලට නියමිත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සංශෝධනය කර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසව පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතු වූවත් එසේ අනුමැතිය ලැබී නොතිබුණු සේවකයින් 79 දෙනෙකු 2010 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුල අළුතින් බඳවා ගෙන තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද අවසන් මල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතුවලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.11,962,185 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.6,014,435 ක අතිරික්තයක් වීමෙන් අතිරික්තයේ වැඩිවීම රු.5,947,750 ක් විය. අතිරික්තයේ වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ මුදල් දායකත්වය වැඩි වීම හා ක්ෂය වියදම අඩුවීමයි.

### 2.2 සේවක මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) (i) 2010 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 168 ක් වූ අතර, අතිරික්ත සේවකයින් සංඛ්‍යාව 107 ක් විය.

(ii) කොන්ත්‍රාත් පදනම මත පත්කළ එක් සේවකයෙකුද ඇතුළුව රියදුරන් 13 දෙනෙකු පත් කර තිබුණද, අධිකාරිය සතුව පැවති වාහන ගණන 08 ක් පමණක් විය.

(iii) රු.283,815 ක් වටිනා පුස්තකාල පොත් සහිත පුස්තකාලයක් අධිකාරිය සතුව පැවතුණද, පුස්තකාලාධිපති හා සහකාර පුස්තකාලයාධිපති තනතුරු පුරප්පාඩු වී තිබුණි.

(iv) අධිකාරිය සඳහා සරප් කෙනෙකු බඳවාගෙන නොතිබුණි.

(v) පරිවර්තන තනතුරක් අනුමත කාර්ය මණ්ඩලයේ වුවද, ඒ සඳහා නිසි බඳවා ගැනීමක් නොකොට, රු.160,382 ක මුදලක් පරිවර්තන ගාස්තු ලෙස වෙනත් පුද්ගලයන් වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් අධිකාරියේ සභාපතිවරයා විගණනය වෙත දන්වා තිබුණේ පවතින වැටුප් ව්‍යුහයන් තුළ නිලධාරියකු බඳවා ගැනීම ප්‍රායෝගික නොවන බවයි.

(vi) තථ්‍ය කාර්ය මණ්ඩලය තුළ ලඝු ලේඛක නිලධාරීන් 04 දෙනෙකු වුවද, වෘත්තීය ගාස්තු ලෙස රු.263,900 ක මුදලක් ගෙවා ලඝු ලේඛන සේවාවක් ලබාගෙන තිබුණු අතර, එම සේවාවේ අවශ්‍යතාවය හා අනුමැතිය සම්බන්ධව සභාපතිවරයා විගණනයට ඉදිරිපත් කර තිබුණේ වෙළඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශ ලේකම් විසින් 2009 සැප්තැම්බර් 29 දින සිට වසරක කාලයක් සඳහා ලබා දුන් අනුමැතියක් පමණි.

(ආ) විගණනයේදී අනාවරණය වූ පරිදි කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් 06 දෙනෙකු නිකවැරටිය පදේශයේ සේවයේ යොදවා තිබුණද, එම ප්‍රදේශයේ අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලයක් පිහිටුවා නොතිබුණි. ඒ පිළිබඳ විස්තර විගණනය වෙත ඉල්ලා සිටියද, අධිකාරිය අදාල තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 අවිනිශ්චිත ස්වභාවයේ ගනුදෙනු**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල

කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය වර්තමානයේ පවත්වාගෙන යනු ලබන්නේ කඩා ඉවත් කිරීමට යෝජිත කිසිදු සනීපාරක්ෂක හෝ ජල පහසුකමක් නොමැති පැරණි ගොඩනැගිල්ලක බැවින්, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදි කරනු

ලබන නව ගොඩනැගිල්ලක කාර්යාලය සඳහා කොටසක් වෙන් කර ගැනීමට 2009 හා 2010 වර්ෂවල එකතුව රු.මි. 1 ක මුදලක් ගෙවා තිබුණි. එසේම 2010 වර්ෂයේ අවසන් ගිණුම්වල දක්වා ඇති පරිදි, වර්ෂය අවසාන වන විට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇතත්, 2011 සැප්තැම්බර් 30 දින දක්වා ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) මාධ්‍ය ඒකකයක් පිහිටුවීම
-----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2010 වර්ෂය තුළ අධිකාරිය මාධ්‍ය ඒකකයක් පිහිටුවා අනුමත සේවක සංඛ්‍යාව තුළ නොවූ මාධ්‍ය නිලධාරියෙක් රු.20,525 ක මාසික වැටුපකට 2010 ජුනි 01 දින සිට කොන්ත්‍රාත් පදනමින් පත් කර තිබුණි.

(ii) මෙම නිලධාරියා වෙත අනුයුක්ත කර තිබූ වාහනය සඳහා මාසිකව රු.50,000 ක කුලියක් හා මාසිකව ඉන්ධන ලීටර් 120 ක් ලබා දී තිබියදීත් අංක CAA/AHR/47/2010 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව, සංචිත වාහනයක් ලෙස සලකා සීමාරහිතව ඉන්ධන ලබා දීමට අනුමැතිය ලබා දී තිබුණි.

(iii) මෙම නිලධාරියාට ගෙවා තිබූ අතිකාල සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, මාධ්‍ය කටයුතුවලට සම්බන්ධ රියදුරන් දෙදෙනෙකු හට මාසික වැටුප ඉක්මවා රු.49,643 ක අතිකාල දීමනාද, ඉන් එක් රියදුරෙකුට අමාත්‍යාංශයේ මාධ්‍ය රාජකාරි වෙනුවෙන් අතිකාල දීමනාද ගෙවා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) වැටුප ඉක්මවා අතිකාල දීමනා ගෙවීම
------------------------------------------

අධිකාරියේ සේවකයන් 11 දෙනෙකුට 2010 වර්ෂයේ සමහර මාසවල මාසික වැටුප ඉක්මවා එකතුව රු.749,465 ක අතිකාල දීමනාද සමහර අවස්ථාවලදී වැටුපෙන් 75% ඉක්මවා එකතුව රු.266,244 ක අතිකාල දීමනාද ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන් සඳහා ආපදා ණය ගෙවීම
--------------------------------------------------------------------------------

අධිකාරිය විසින පිළියෙල කර තිබූ පරිපාලන ක්‍රියාපටිපාටි මගපෙන්වීම්වලට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් තිදෙනෙකුට ආපදා ණය ලබා දී තිබුණු අතර, මේ සම්බන්ධයෙන් අධිකාරියේ සභාපති විගණනයට දන්වා ඇත්තේ ණය ලබා දී ඇත්තේ එම සේවකයින් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුව බවයි. කෙසේ වුවද, සේවකයින් ස්ථිර කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ඉ) අංක සීඑම්/එච්ආර්එම්/97/2010/ඒම්බී - 09 - 04 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණය මත අමාත්‍යාංශය සතු වාහනයක් අධිකාරයට පවරා ගැනීමට තීරණය කර තිබුණද, ඒ අනුව කටයුතු නොකර එම වාහනයේ අළුත්වැඩියා වෙනුවෙන් වෙන් කර තිබුණු රු.3,147,903 ක් උපචිත වියදම්වල ඇතුළත් කර තිබුණි.

3. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) වාහන පාලනය

(ආ) අත්තිකාරම් ලබාදීම

(ඇ) වාහන කුලියට ලබා ගැනීම

(ඇ) සේවක කළමනාකරණය